# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1804/18 - 2013 අප්‍රේල් මස 03 වැනි බදාදා - 2013.04.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**1969 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාව සහ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (3) වන උප වගන්තිය සහ 14 වන වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2013 මාර්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2013 අංක 2 දරන ආනයන හා අපනයන (පාලන) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.
2. 2013 මාර්තු මස 01 වැනි දිනැති අංක 1799/15 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් මෙරටට ආනයනය කිරීම තහනම් කරනු ලැබූ සංයෝජිත වර්ගීකරණ සංකේත යටතේ වන ඊතයිල් මද්‍යසාරය, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කරනු ලබන බලපත්‍ර අධිකාරියට යටත්ව ශ්‍රී ලංකාවට ආනයනය කිරීමට අවසර දෙනු ලබන්නේය.
3. ඉහත 2 නියෝගයේ දක්වා ඇති පරිදි ආනයනකරුවන්හට මෙම බලපත්‍ර නිකුත් කරනුයේ පහත දැක්වෙන නියමයන්ට හා කොන්දේසිවලට යටත්වය.
    i. සුරාබදු ආඥාපනත යටතේ සුරාබදු බලපත්‍රයක් ලබාගෙන තිබිය යුතුය.
    ii. ආනයනකරුවන් විසින් නිෂ්පාදන බදු, එකතු කළ අගය මත බදු, ආදායම් බදු ඇතුළු කලින් කලට නියම කෙරෙන අනෙකුත් බදු නියමිත පරිදි ගෙවා ඇති බව සනාථ කළ යුතුය.
    iii. සුරාබදු කොමසාරිස්වරයා කලින් කලට දේශීයව මිලදී ගැනීමට කරනු ලබන නියමයන්ට යටත් විය යුතුය.
    iv. ආනයනය කරනු ලබන ඊතයිල් මද්‍යසාරය පිළිගත් ප්‍රමිතිවලට අනුකූලවිය යුතුය.
4. ඉහත 2 සහ 3 නියෝග, 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල පනත යටතේ ස්ථාපිත ව්‍යාපාර ආයතනවලට ද අදාළ වන්නේය.

04 - 510

1A - PG 001599 — 935 (2013/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*